**BELIEVERS EASTERN CHURCH**
World Headquarters, St Thomas Community
Thiruvalla - 689 103, Kerala, India

# එඬේර හසුන

2025 අප්‍රේල්/මැයි

## මාගේ ආදරණීය එඬේරුන් සහ ශුද්ධ වූ සභාවේ සියලුම විශ්වාසිකයිනි,

අපගේ ස්වාමීන් සහ ගැළවුම්කරුවාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ අනුග්‍රහය, කරුණාව, සහ සාමය ඔබ සමග වේවා! ✠ ආමෙන්.

අප සභා ඉතිහාසයේ ඉතාමත් වැදගත් අවස්ථාවන්ගෙන් එකක් වන, අපගේ ඇතනේසියන් පළමු යොහාන් මෙට්‍රොපොලිටන් පියාණන්ගේ ආශිර්වාදලත් මතකයේ පළමු අනුස්මරණය වෙත ඔබ සියලු දෙනාගේ අවධානය යොමු කිරීමට මම අද ඔබ අමතන්නෙමි. 2025 මැයි මස 08 වෙනි දිනට ඔවුන් වහන්සේ සදාකාලික විවේකයට ඇතුල් වී වසරක් සපිරෙනු ඇත.

ඔවුන් වහන්සේගේ මෙලොවින් නික්ම යාම පිළිබඳව සභාවක් ලෙස අපට තේරුම් ගැනීම ඉතාමත් අසීරු කරුණක් වුවද ඔවුන් වහන්සේගේ මතකයන් ජීවමානව තබා ගැනීමේ වගකීම අප සතුව ඇත. එබැවින් ඔවුන් වහන්සේ අපට උගන්වනු ලැබූ දේ අපගේ ජීවිතයේ දී අනුගමනය කරමින් ඔවුන් වහන්සේ ආරම්භ කරනු ලැබූ කාර්යය නොකඩවා ඉදිරියට පවත්වාගෙන යමින් එය අපගේ ඊළඟ පරම්පරාවට උරුම කර දෙමින් ඔවුන් වහන්සේගේ ජීවිතාදර්ශය අනුකරණය කරන ලෙස මම ඔබ සැමගෙන් ආදරයෙන් ඉල්ලා සිටිමි. මෙම වගකීම බරක් ලෙස නොව අප සැම කෙනෙකුටම මහත් ප්‍රීතියක් සහ ගෞරවයක් ගෙන දෙන ආකාරයෙන් - දැඩි ආශාවකින් සහ කැපවීමකින් යුතුව එය වැළඳගත යුතුය.

**අපගෙන් උකුත්ව සදාදර මතකයක් වූ මෙට්‍රොපොලිටන් ඇතනේසියස් පළමු යොහාන් පියාණන්ගේ ආශිර්වාදලත් මතකයන් අනුස්මරණය කිරීමට අපගේ ශුද්ධ වූ සභාව සූදානම් වන්නේය. අපි සියලු දෙනාම මෙම පූජණීය සැමරුමට සහභාගි වීම සඳහා අපගේ සිත මනස යොමු කළ යුතුය. එමෙන්ම උකුත්ව ගියා වූ අපගේ ආත්මික පියාණන්ගේ ජීවිතය සහ උරුමය උදෙසා සර්වබලධාරී දෙවියන් වහන්සේට යාච්ඤා කිරීමටත් තුති පුද කිරීමටත් අප මීසමක් වශයෙන් එකතු විය යුතුය. කරුණාකර මෙම අනුස්මරණය අක්‍රියාකාරී මතකයක් ලෙස ඔබගේ බිත්ති හතරට සීමා නොකරන්න. ඒ උදෙසා තව පියවරක් ඉදිරියට තබන්න. සදාකාලික මතකයක් වූ අපගේ මෙට්‍රොපොලිටන් පියාණන් අපට ඉගැන්වූ ආකාරයට ඔවුන් වහන්සේගේ මතකය ක්‍රියාවට නගන්න; ඒ සඳහා අවශ්‍යතාවයෙන් පෙළෙන ලෝකයට ප්‍රේමයෙන් සහ දයාවෙන් යුතුව සේවය කරන්න.**

**ආත්මික පියා වශයෙන්, සදාකාලික මතකයක් වූ අපගේ මෙට්‍රොපොලිටන් පියාණන්ගේ ජීවන රටාවේ ප්‍රධාන අංගයන් කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවීමට මම කැමැත්තෙමි - එවිට මෙම විශේෂිත දිනයේදී පමණක් නොව අපගේ ජීවිතයේ සෑම දිනකදීම ඒවා අනුගමනය කරමින් ජීවත් වීමට අපට හැකිවනු ඇත.**

1. **දයානුකම්පාවේ සහ ත්‍යාගිශීලීත්වයේ ක්‍රියාවන්:** අපගේ සදාකාලික මතකයක් වූ පියාණන්ගේ හදවත, දුප්පතුන්, රෝගීන් සහ අවධානයක් නොමැති අය උදෙසා බිඳී ගිය අතර, එතුමාණන් ද ක්‍රිස්තුන් වහන්සේ මෙන්, එම පුද්ගලයින් කෙරෙහි ඇති ප්‍රේමය කරණකොටගෙන ඔවුන් උදෙසා මහත් කැපකිරීම් කරනු ලැබීය. ඔවුන් වහන්සේව සිහිපත් කිරීම උදෙසා ත්‍යාගිශීලී කටයුතු වල නිරත වෙමින්, රෝගීන් බැහැ දකිමින්, ඔබගේ ප්‍රජාව තුළ සරල කාරුණික ක්‍රියා වල නිරත වන ලෙස මම ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

2. **දිනපතා යාච්ඤාවන් සහ පිළිඹිබු කිරීම** සභාවක් ලෙස නොනවත්වා යාච්ඤා කරන ලෙසත්, ජේසුස් වහන්සේගේ යාච්ඤාව අපගේ දෛනික ජීවිතයේ කොටසක් බවට පත් කරගන්නා ලෙසත්; සදාකාලික මතකයක් වූ අපගේ පියාණන් අපව දිරිමත් කරනු ලැබීය. එබැවින් පුද්ගලික යාච්ඤාව, පවුලේ යාච්ඤාව, දිව්‍යමය ජනවන්දනාවට සහභාගිවීම, ජේසුස් වහන්සේගේ යාච්ඤාව විශ්වාසවන්තව කිරීම යනාදී දේ තුළින් අපි සියලු දෙනා ගැඹුරු යාච්ඤා ජීවිතයකට කැප වෙමු.

3. **සභාවට සහ ප්‍රජාවට සේවය කිරීම:** සදාකාලික මතකයක් වූ අපගේ පියාණන් ශුද්ධ වූ සභාවට මුළු හදවතින්ම ප්‍රේම කළ අතර, එය ගොඩනැගීම උදෙසා වෙහෙස නොබලා සේවය කළේය. ඔවුන් වහන්සේ නිතරන්තරයෙන්ම "සභාව ගැන සිතන්න" යනුවෙන් ප්‍රකාශ කළේය. එබැවින් අප අපගේ සභාවේ වර්ධනය උදෙසාත් එය කරණකොටගෙන ප්‍රජාවේ යහපැවැත්ම උදෙසාත් අපගේ කාලයත් දක්ෂතාවයනුත් කැප කරමින් ඔවුන් වහන්සේගේ කාර්යය දිගටම පවත්වා ගනිමු. මීසමේ නොයෙක් කාර්යයන් සඳහා සේවය කිරීමට අපට ලොකු කුඩා අවස්ථාවන් ගැණිය නොහැකි තරම් ඇති අතර, සභාවේ සේවයට සහයෝගය දැක්වීම සහ ප්‍රජා සම්බන්ධතාවයන් සඳහා සහාය වීම වැනි ක්‍රියාකාරකම් වලට අපට දායක විය හැකිය.

4. **අනාගත පරපුර උදෙසා විශ්වාසය ආරක්ෂා කිරීම:** සදාකාලික මතකයක් වූ අපගේ පියාණන් දරුවන්ට මහත් සේ ප්‍රේම කළ අතර, සෑම දෙයකදීම ඔවුන් හට ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබීය. ඉරිදා දහම් පාසල, බිලීවර්ස් යූත්, කාන්තා එකමුතුව, ධර්මෝපදේශයන් (කැටකිසම්), යාච්ඤාව සහ ජීවිතාදර්ශය යන දේ තුළින් ශුද්ධ වූ සභාවේ ජීවිතය අපගේ ඊළඟ පරපුර වෙත ලබා දීමට අපි කැප වෙමු. අපගේ සභාව හැඩගස්වා ගනු ලැබූ ඇදහිල්ල සහ සම්ප්‍රදායන් අනාගත පරපුර වෙත අඛණ්ඩව පෝෂණය කරමින් හැඩගැස්වන බවට සදාකාලික මතකයක් වූ අපගේ පියාණන් හට අපි සහතික වෙමු.

**මාගේ ප්‍රේමවන්තයිනි, අසන්නන් බවට පමණක් පත් නොවී වඩාත් වැදගත් දෙය වන ක්‍රියාකාරීව කටයුතු කරන්නන් බවට පත්වන ලෙස මා ඔබගෙන් උදක්ම ඉල්ලා සිටින්නෙමු. අපගේ සභාවේ පියාණන් වන ඇතනේසියස් පළමු යොහාන් මෙට්‍රොපොලිටන් හිමිපාණන්ගේ ආශිර්වාදලත් මතකයේ ජීවන රටාව අපි මුළු හදවතින්ම වැළඳ ගමු.**

**එසේම මතක තබා ගන්න, ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ දෑත්, මුඛය, සහ පාද වීමට අපව කැඳවා ඇත්තේ අන් අයට සේවය කිරීමට සහ අප තුළ මුද්‍රා තබා ඇති ක්‍රිස්තුන් වහන්සේගේ ස්වරූපය පිළිඹිබු කිරීම පිණිසය. එබැවින් අපි නොනවත්වා ක්‍රිස්තුන් වහන්සේ මෙන් වීමට කටයුතු කරමු. ඔවුන් වහන්සේගේ මතකය සදාකාලික වේවා!**

**ශුද්ධ වූ ත්‍රිත්වයේඃ පියාණන් වහන්සේ, පුත්‍රයාණන් වහන්සේ සහ ශුද්ධාත්මයාණන් වහන්සේගේ බහුල අනුග්‍රහය සහ කරුණාවෙන් අපට මඟ පෙන්වන අතර, ඔවුන් වහන්සේගේ සිංහාසනය ඉදිරියේ සියලු ශාන්තුවරයන්ගේ සහ ශුද්ධ වූ දේව මාතාවන්ගේ මැදිහත්වීම් තුළින් දැනුත් සඳහටත් අපට ආරක්ෂාව ලැබේවා. - ✠ආමෙන්.**

ප්‍රේමය සහ යාච්ඤාව සමගින් පිය සෙනෙහසින් ,

මෝරන් මෝර් සාමුවෙල් තියෝපිලස්
මෙට්‍රොපොලිටන් හිමිපාණන්.

දිනය :2025 අප්‍රේල් මස 15 වෙනි දින

ස්ථානයඃ ලෝක මූලස්ථානය.

---

**සැ.යුඃ කරුණාකර මෙය සියලුම ප්‍රාදේශීය භාෂාවන්ට පරිවර්තනය කර විශ්වාසිකයින් දිරිගැන්වීම සඳහා සියලුම දේවස්ථාන වල කියවීමට කටයුතු කරන්න.**